# ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
# උපාධි ප්‍රදානෝත්සවය - 2021

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ තෙවන උපාධි ප්‍රදානෝත්සවය 2022 මාර්තු මස 23 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වනු ලැබේ.

2022 වර්ෂයේ මාර්තු මස 15 දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පහත සදහන් පීඨ මගින් පවත්වන ලද අවසාන පරීක්ෂණවලින් සමත් ව විභාග අංශය මගින් ප්‍රතිඵල නිකුත් කර ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත මෙම උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි පිරිනමනු ලැබේ.

- ධීවර හා සාගර විද්‍යා පීඨය
- ඉංජිනේරු හා කළමණාකරන පීඨය

**<u>උපාධි ප්‍රදානෝත්සවය සදහා ඉල්ලුම් කිරීම</u>**

උපාධි ප්‍රදානෝත්සවය පිළිබද වැඩි විස්තර සහ අයදුම් පත්‍රය www.ocu.ac.lk වෙබ් අඩවියෙන් භාගත කර සම්පූර්ණ කර ලියාපදිංචි ගාස්තුව ද ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය මගින් මෝදර මහජන බැංකු ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක **214-1-001-6-3629909** යට බැර වනසේ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවිය යුතුය. උපාධිලාභින් මුදල් ගෙවන්නා ලෙස තම නම සහ ලියාපදිංචි අංකය සදහන් කල යුතු අතර ඉල්ලුම්පත්‍රය සමග **<u>මුදල් ගෙවන ලද රිසිට් පත අමුණා විභාග අංශය වෙත අනිවාර්යයෙන්ම භාර දිය යුතුය.</u>**

**<u>අයදුම්පත්‍රය භාර දීම හා උපාධි ලෝගුව නිකුත් කිරීම</u>**

ඉල්ලුම්පත්‍රය භාර දිම සදහා 2022 මාර්තු මස 12 සහ 13 යන දිනයන්හි අදාල කණ්ඩායම පමණක් විභාග අංශයට පැමිණ භාර දිය යුතුය. පැමිණිය යුතු කණ්ඩායම් පිළිබද වැඩි විස්තර www.ocu.ac.lk වෙබ් අඩවියෙන් ලබාගත යුතුව ඇත.

වැඩි විස්තර 0114346976/0114346977 දුරකතනය ඔස්සේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/විභාග වෙතින් හෝ www.ocu.ac.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

ලේඛකාධිකාරී<br>
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය